තුම්පනේ ප්‍රාදේශීය සභාව.
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන.

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 16 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2** මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**1.3.1** ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් නැගුම ප්‍රතිපාදන යටතේ සරත් අමුණුගම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම සඳහා වැය කළ රු.3,053,758 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවෙන් ලැබී තිබූ ඖෂධ තොගයේ වටිනාකම වූ රු.240,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ දි උඩරට සංවර්ධන අධිකාරියෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු පරිගණක යන්ත්‍ර 20 ක වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂය තුලදී පරිත්‍යාග වශයෙන් ලැබි තිබූ රු.231,900 ක් වටිනා කාය වර්ධන උපකරණ හා උපාංග ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සභාව සතු රු.99,260 ක් වටිනා ඉඩම් කැබලි 111 ක වටිනාකම සහ වටිනාකම හඳුනා ගෙන නොමැති ඉඩම් කැබලි 08 හී වටිනාකම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ස්ථාවර වත්කම් විෂයයන් 67 ක වටිනාකම වූ රු.787,358 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂයේ රු.232,140 කට මිල දි ගෙන තිබුණු සෙන්ට්‍රික් වතුර පොම්පයේ වටිනාකම රු.2,232,140 ක් ලෙස ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන්, වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම රු.2,000,000 කින් වැඩියෙන් දැක්වුණි.

(ඌ) යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණු රු.106,995 ක් වූ බයෝෂෙල් ටැංකියේ වටිනාකම ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(එ) යන්ත්‍රෝපකරණ යටගේ ගිණුම්ගත කර තිබුණු රු.964,000 ක් වූ මාර්ග තලනයේ වටිනාකම්, මෝටර් රථ ගිණුමේ රු.960,000 ක් වශයෙන් දක්වා තිබුණි.

(ඒ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් සමාලෝචිත වර්ෂයේදි ලැබී තිබුණු රු.442,858 ක් වූ ගැල්වනයිස් බට (GI) 400 හි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සභාවේ භෞතිකව නොමැති රු.66,915 ක් වටිනා වත්කම් විෂයයන් 30 ක් ගිණුම්වල දක්වා තිබුණු අතර මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

**1.3.2** නොසැසඳු පාලන ගිණුම්.

ගිණුම් විෂයයන් 02 ක පාලන ගිණුම් අනුව ශේෂය, උපලේඛන අනුව, ශේෂය සමග සැසදීමේ දි, රු.2,823,690 ක නොසැසදීම් අනාවරණය විය.

**1.3.3** විගණනය සඳහා සාක්ෂි නොවීම.

ගිණුම් විෂයයන් 02 කට අදාල තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.17,187,938 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරික්ෂා කිරිමට නොහැකි විය.

**1.3.4** ලැබියයුතු ගිණුම්.

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 04 ක එකතු වටිනාකම රු.134,068,013 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.11,976,631 ක් වී තිබුණි.

**1.3.5** ගෙවියයුතු ගිණුම්.

2014 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකම රු.125,993,137 ක් වූ අතර, එයින් අවුරුදු 02 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.15,534,964 ක් වී තිබුණි.

**1.3.6** නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසීවලට අනුකූල නොවූ අවස්ථා නිරික්ෂණය කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| 132 වගන්තිය | ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් දැරීමට ඉඩ දී නොමැති කටයුත්තක් වූ සභාපතිවරයාගේ විස්තර ඇතුළත් නාම පත්‍ර (Visiting Card) මුද්‍රණය සඳහා රු.18,000 ක් වැය කර තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය.**

| | | |
|---|---|---|
| **I.** | **මු.රෙ.371** | **විවිධ කාර්යයන් සඳහා ලබා දෙන අත්තිකාරම් අදාළ කාර්යය නිම වූ වහාම පිය වියයුතු වුවත්, අවස්ථා 04 ක දී ලබා දී තිබුණු රු.36,525 ක අත්තිකාරම් වසර 03 කට අධික කාලයක සිට පියවීමට කටයුතු කර නොතිබුණි.** |
| **ii** | **මු.රෙ.571(2)** | **රු.259,021 ක් වටිනා ඉකුත් තැන්පතු විෂයයන් 17 ක් සම්බන්ධව යොමුගත රෙගුලාසිය අනුව කටයුතු කර නොතිබුණි.** |

**(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පාරිපාලන) රීති මාලාව.**

| | |
|---|---|
| **177 හා 178 වගන්ති.** | **ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව රු.5,819,483 ක් වටිනා කර්මාන්ත 19 ක ඉදිකිරීම් ප්‍රජා සංවිධානවලට පවරා තිබුණි.** |

**2. මූල්‍ය සමාලෝචනය.**

**2.1 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,772,071 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,778,774 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.13,993,297 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 ආදායම් පරිපාලනය.**

**2.1.1 වරිපනම් බදු**

**(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීමේ අගය රු.880,810 ක් වූ අතර, වර්ෂයේ අය කිරීම් රු.554,540 ක වූයෙන්, අයවීමේ ප්‍රතිශතය සියයට 63 ක් වී තිබුණි. තව ද, 2014 දෙසැම්බර් 31 දිනට හිග හිටි වරිපනම් බදු ශේෂය රු.458,987 ක් වූයෙන්, එම හිග ශේෂ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) හා 159(1) වගන්ති ප්‍රකාර 2015 ජුලි 10 වන විටත් කටයුතු කර නොතිබුණි.**

**(ආ) සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය කරන දේපළ වර්ෂ 05 කට වරක් තක්සේරු කර, වරිපනම් බදු අය කළයුතු වුවත්, 2004 වර්ෂයේ කරන ලද තක්සේරුව පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂය තුළ ද වරිපනම් බදු තීරණය කර අයකර තිබුණි.**

**2.2.2 ජල ගාස්තු.**

---------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.359,028 ක හිගයක් පැවති අතර, එම හිගයෙන් වර්ෂය අවසාන දිනට රු.86,696 ක් අය වියයුතුව තිබුණි. වර්ෂයේ බිල් කිරීම්වලින් වර්ෂයේ අවසානයට හිඟය රු.279,592 ක් විය. ජල ගාස්තු අය කිරීම දුර්වල මට්ටමක පැවතුණු අතර, එම හිඟ මුදල් අය කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙළක් අනුගමනය නොකිරීම හේතුවෙන් ආරම්භක ශේෂයේ රු.272,294 ක වෙනසක් ද නිරීක්ෂණය වුණි.

**2.2.3 ත්‍රිරෝද රථ ගාස්තු.**

------------------------

සමාලෝචිත වර්ෂයේ අරම්භක දිනට රු.917,850 ක හිගයක් පැවති අතර, එම ශේෂයෙන් වර්ෂය අවසාන දිනට රු.307,650 ක් අය කර ගෙන නොතිබුණි. වර්ෂයේ බිල් කිරීම්වල හිගය සහ ආරම්භක ශේෂයේ නොසැසඳීම් ද ඇතුළුව සහා බල ප්‍රදේශයේ ත්‍රිරෝද රථ සංගම්වලින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.774,450 ක මුදලක් අය කර ගැනීමට තිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.554,539 ක් සහ මුද්දර ගාස්තු රු.7,678,600 ක් ලැබිය යුතුව පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ සභාවේ සමුච්චිත අරමුදල රු.11,479,250 ක හර ශේෂයක් වූ අතර මෙම තත්ත්වය වසර 02 ක සිට දිගින් දිගටම පැවතිණ. ඉකුත් වසර 02 ක් තුළ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ද ඌනතාවයක් විය.

(ආ) පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ ප්‍රාග්ධන ස්වරූපයේ කටයුතුවල නඩත්තුව සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ලබා දී තිබූ රු.4,000,000 ක මුදල් අදාළ කටයුතුවලට නොයොදවා සභාවේ වැටුප් ගෙවීම් සඳහා වැය කර තිබුණි.

(ඇ) ඖෂධ ජලනළ යනාදි වර්ෂය තුල සම්පූර්ණයෙන් නිකුත් නොවන ද්‍රව්‍ය මිලදී ගැනීම් ගිණුම් තැබීමේදී ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

---------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,419,619 ක් වටිනා වත්කම් විෂයයන් 04 ක් අවුරුදු 02 කට වැඩි කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතින.

**3.3** කොන්ත්‍රාත් පරිපාලනය.

(අ) උඩදෙණිය මාර්ගය සංවර්ධනය කිරිම

මාර්ගය දෙපස ඇල මාර්ගය සංවර්ධනය කළ පසු පස් පුරවා මාර්ගය කොන්ක්‍රිට් කර තිබුණ ද මාර්ගය දෙපස පස් ඛාදනයට ලක් වී ඇති බැවින් මාර්ගයේ පැවැත්වීමට බාධාවක් වී තිබූ බව 2015 මාර්තු 16 දින කරන ලද භෞතික පරික්ෂාවේදි අනාවරණය විය.

(ආ) වැලිවිට එගොඩගන්ද පාර සංවර්ධනය කිරීම.

2015 මාර්තු 11 දින කරන ලද භෞතික පරික්ෂාවේදි පහත කරුණු අනාවරණය විය.

i. මාර්ගය ආරම්භයේ සිට මී.15 ක් දුරින් මාර්ගය අඩි 09 ක් පළලට පුපුරා ගොස් තිබුණි.

ii. කොන්ක්‍රීට් මාර්ග තලයේ ප්‍රසාරණ මූට්ටු අවම වශයෙන් අඩි 10 ක පරාසයකින් යෙදියයුතු වුවත්, ප්‍රසාරණය මූට්ටු මාර්ගය ආරම්භයේ සිට අඩි 66 ක් දුරකින් ද, එතැන් සිට අඩි 44 කින් ද යොදා තිබුණි.

(ඇ) දොඩංගොල්ල මාර්ගය සංවර්ධනය කිරිම

රු.997,000 ක් වැය කර ඉදිකරන ලද මාර්ගය සම්බන්ධව 2015 මාර්තු 11 දින කරන ලද භෞතික පරික්ෂාවේ දි, මාර්ගය ස්ථාන කිහිපයකින් පුපුරා ඉරි තලා ගොස් තිබුණු අතර, ඇස්තමේන්තු ප්‍රකාරව 1:2:4(3/4)" කොන්ක්‍රීට් මිශ්‍රණය යෙදිය යුතු වුවත්, මාර්ගයට යොදා තිබුණු කොන්ක්‍රීට් මිශ්‍රණය ඇස්තමේන්තුගත ප්‍රමිතියට යොදා නොතිබුණු බැවින්, කොන්ක්‍රීට් පහසුවෙන් කැඩිය හැකි ආකාරයෙන් දුර්වල තත්ත්වයක පවතුණි. එසේම, රු.7,000 ක් වැය කර යොදා තිබු නාම පුවරුව ගළවා ඉවත් කර තිබුණි.

**3.4** ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ දිනකට කසළ ටොන් 5 - 6 ක් අතර ප්‍රමාණයක් එකතු වන අතර කසළ එකතු කිරිම සඳහා වාහන 02 ක් යොදවා එකතු වන කසළ වර්ගීකරණයකින් තොරව සභාව සතු ඉඩමකට බැහැර කිරිම කර තිබුණි.

(ආ) ජයිකා පුහුණුලාභීන්ගේ සංගමය හා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විවිධ පුහුණු වැඩසටහන්, පරිසර නිලධාරීන්, ලේකම්, කාර්මික නිලධාරීන් හා නවක උපාධිධාරීන් වෙනුවෙන් ක්‍රියාත්මක කර තිබුණ ද, කසළ කළමනාකරණය සම්බන්ධව විධිමත් වැඩපිළිවෙළක් සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.5** ව්‍යාපෘති ප්‍රමාද කිරීම.

කීණිගම ජල යෝජනා ක්‍රමය සඳහා 2012 වර්ෂයේ ගම නැගුම අරමුදල් යටතේ රු.2,000,000 ක මුදලක් වැය කර තිබුණ ද, 2015 වර්ෂය වන විටත් අදාළ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1 ප්‍රසම්පාදන සැලැස්ම.**

**රු.224,354,714 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.**

**4.2 ක්‍රියාකාරී සැලැස්ම.**

**සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 අභ්‍යන්තර විගණනය.**

**අභ්‍යන්තර විගණන නිලධාරියකු පත් කර තිබුණ ද, ප්‍රමාණවත් විගණනයක් සිදු කර විමසුම් නිකුත් කර නොතිබුණි.**

**4.4 අයවැය පාලනය.**

**සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 04 ක සියයට 30 සිට සියයට 100 ඉක්මවා ද, වියදම් විෂයයන් 07 ක සියයට 29 සිට සියයට 100 ඉක්මවා ද විචලනයක් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.**

**5. පද්ධති හා පාලනය.**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය**
**(ආ) අයවැය පාලනය**
**(ඇ) ආදායම් පරිපාලනය**
**(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය**
**(ඉ) වත්කම් කළමනාකරණය**